www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# චීන විරෝධී පුච්චානම් යුද තර්ජනය මතු කරයි

## Anti-China rhetoric raises threat of war

**2011 ඔක්තෝබර් 07**

**චී**නයට එරෙහිව එක්සත් ජනපද මූල්‍ය යුද්ධයකට වරම් දෙමින් පක්ෂ දෙකේම සහයෝගය ඇතිව ඔක්තෝබර් 06දා ගොනුකල පෙත්සම සෙනේට් සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීම වනාහි නරුම විකර්ෂනයකි. වෝල් වීදියට එරෙහිව යොමුවී තිබෙන විරෝධතා රැල්ල හමුවේ ඩිමොක්‍රටිකයින් ඇමරිකානු ධනවාදයේ අර්බුදයට විදේශික දුක්ගන්නා රාල කෙනෙක් සොයාගැනීමේ උත්සාහයකට මුලපුරා ඇත.

මිචිගන්හි ඩෙබී ස්ටැබිනොව්, නිව් යෝර්ක්හි චාල්ස් ෂූමර් හා පෙන්සිල්වේනියාවේ රොබට් කැසී යන අනෙකුත් කාර්මික ප්‍රාන්තවලින් ආ මධ්‍යම ආන්ඩුවේ ඩිමොක්‍රටිකයින්ගේ ද උද්යෝගිමත් සහයෝගය ඇතිව එම පනත ඉදිරිපත් කලේ එක්සත් ජනපද නිෂ්පාදනය බිඳ වැටීමෙන් දරුනු ලෙස පීඩාවට පත්වූ ප්‍රාන්තයන් අතුරෙන් එකක් වන ඔහියෝහි සෙනේට් සභික ෂෙරඩ් බ්‍රවුන් විසිනි

පනත පිලිබඳ විවාදය අවසානයකට ගෙන ඒම පිනිස 62-38ක ඡන්දයක් ලබාදීමට බොහෝ ඩිමොක්‍රටිකයින් සමග රිපබ්ලිකන් සෙනේට් සභිකයින් 12 කෙනෙක් ද එක්වූහ. උතුරු කැරොලයිනාහි රිචඩ් බර්, මිසිසිපිහි තැඩ් කොක්රාන්, ජෝර්ජියාහි සැක්ස්බයි චැම්බ්ලිස් හා ජොනී අයිසැක්සන් මෙන්ම ඇලබාමාහි ජෙෆර්සන් සෙෂන්ස් හා රිචඩ් ෂෙල්බි වැනි රෙදි මෝල් වසාදැමීමෙන් විනාශයට පත්ව ඇති දක්ෂින ප්‍රාන්තයන්හි හය දෙනෙක් ද ඇතුලු සෙනේට් සභාවේ අතිශයින්ම කුප්‍රකට ප්‍රතිගාමීන් ඊට ඇතුලත් විය.

කොන්ග්‍රසයේ සිටින අන්ත යුදවාදී රිපබ්ලිකානුවෙකු වන කැරොලයිනාහි ලින්ඩ්සේ ග්‍රේහැම් පනත සෙනේට් සභාවේ විවාදයට ගෙන ඒමට අවශ්‍ය ක්‍රමානුගත ඡන්දය 79-19ක් දක්වා ඉහල නැංවීමට 03දා දායක විය. පනතට සහාය දුන් දුසිම් දෙකක් පමන වන රිපබ්ලිකානුවන්ගෙන් කෙනෙකුවූ ග්‍රේහැම් අවසානයේදී එයට විරුද්ධව ඡන්දය දුන්නේ තවත් ප්‍රතිගාමී සංශෝධනයන් ගනනාවක් ඊට එකතු කිරීමේ උත්සාහයක් ලෙස ය.

ග්‍රහ ලෝකයේ තිබෙන අතිශයින්ම කුරිරු හා නිර්දය සංවිධාන වන ඇමරිකානු සංගත හා බැංකු අහිංසක බැටලු පැටවුන් ලෙස පෙන්නුම් කරමින් චීනය අනුගමනය කරනවා යයි කියන කොල්ලකාරී මූල්‍ය හා වෙලඳ ප්‍රතිපත්ති මත එරට දැඩි සේ හෙලාදැකීම පිනිස ඩිමොක්‍රටිකයෝ හා රිපබ්ලිකානුවෝ එකිනෙකා සමග තරග කලහ.

"අප දශකයක් තිස්සේ වෙලඳ යුද්ධයක පැටලී සිටින්නෙමු" යයි කියමින් මෙම පනත ලෝක ආර්ථිකයට ව්‍යසනකාරී ප්‍රතිවිපාක ගෙන එන වෙලඳ යුද්ධයක් අවුලුවාලනු ඇතැයි පලවූ අනතුරු ඇඟවීම් වලට බ්‍රවුන් ප්‍රතිචාර දැක්වූ අතර ෂූමර් "අපගේ පනතෙහි විරුද්ධවාදීහු චීනය සමග වෙලඳ යුද්ධයක් ඇවිලෙනු ඇතැයි කියා සිටිති. හොඳයි, ඔවුන්ට දීම පිනිස පනිවිඩයක් මා ලඟ ඇත. අප දැනටමත් චීනය සමඟ වෙලඳ යුද්ධයක පැටලී සිටින්නෙමු. එසේම එය ඒ තරම් හොඳින් කෙරෙන්නේ ද නැත" යනුවෙන් පවසමින් ඊට හවුල් විය.

පනතට සිය බර තැබීමට මහ බැංකු ප්‍රධානී බෙන් බර්නාන්කේ ද පෙනී සිටියේය ඒ අනුව මූල්‍ය වෙලඳපොලවල් වෙත අත නොගැසීමේ සාමාන්‍ය බැංකු ආස්ථානය අතහැර දැමුනි. ඔහු මෙසේ පැවසීයː "ගෝලීය ආර්ථිකයේ සිදුවිය හැකිව තිබෙන අති සාමාන්‍ය ප්‍රකෘතිකරනයේ ක්‍රියාවලිය චීන මූල්‍ය පිලිවෙත මගින් අවහිර කරන්නේය යන්න මේ දැන් අපගේ කනස්සල්ල වී තිබේ. එය යම්තාක් දුරකට ප්‍රකෘතිමත් වීම කෙරෙහි අහිතකර ලෙස බලපායි"

කියනු ලබන මූල්‍ය අවභාවිතාවන් සඳහා චීනයට දඬුවම් පැනවීමේ පනත විශේෂයෙන්ම නිෂ්පාදන කර්මාන්තය හා එක්සත් මෝටර් රථ කම්කරු සමිතිය හා එක්සත් වානේ කම්කරු සමිතිය වැනි එම කර්මාන්තය වෙනුවෙන් දාසකම් කරන වෘත්තීය සමිති නිලධරයින් සමග සමීප බැඳීම් ඇති කොන්ග්‍රසයේ ඩිමොක්‍රටිකයින් විසින් අලෙවි කරනු ලබයි.

මෙම පනත් මට්ටම් කිහිපයක දී ම දේශපාලන ප්‍රෝඩාවන් ය. පලමුව චීනයට එරෙහිව ආරක්ෂනවාදී පියවර ගැනීම පිනිස ඔබාමා පාලනයට සැබවින්ම බලකිරීමේ අදහසක් ඩිමොක්‍රටිකයින්ට ඇත්තේ නැත. පසුගිය වසරේදී නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ බහුතරය තවමත් ඔවුන්ට තිබිය දී මෙවැනි ම පනතක් එහි දී සම්මත කර ගත්තේ සෙනේට් සභාව එයම අනුගමනය නොකරන බව පැහැදිලිව ම පෙනෙන්නට තිබිය දී ය.

මෙම වසරේදී සෙනේට් සභාව පනත සම්මත කරන අතර වාරයේ නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ බහුතරය සහිත රිපබ්ලිකානුවෝ චීනය සමග වෙලඳම හෝ චීන කම්හල්වල කෙලින්ම සිය භාන්ඩ නිෂ්පාදනය කිරීම මත දැඩි ලෙස යැපෙන සංගතවල අවශ්‍යතා සමඟ හොඳින් බද්ධවී සිටිති. කතානායක ජෝන් බොයිනර් සෙනේට් සභා පනත "අන්තරායකාරී" යයි හෙලාදුටු අතර බහුතරයේ නායක එරික් කැන්ටර් කියා සිටියේ මන්ත්‍රී මන්ඩලය ද එවැනිම පියවරක් අනුගමනය නොකරනු ඇති බවයි.

තව ද කොන්ග්‍රසය නීතිය සම්මත කරනු ලබන්නේ වුවත් මීට පෙර ගෙනආ වෙලඳ යුද්ධයේ පනත් සම්බන්ධයෙන්

ධවල මන්දිරයේ සිටියේ රිපබ්ලිකානුවෙක් වුවත් ඩිමොක්‍රටිකයෙක් වුවත් අනුගමනය කර තිබෙන ආකාරයට එක්කෝ එයට එරෙහිව නිෂේධ බලය යෙදීම නැතිනම් ඉන් පැනවෙන සම්බාධක බල රහිත වන තැනට කටයුතු කරනු ඇත.

06දා පැවති සිය මාධ්‍ය හමුවේදී ඔබාමා චීන විරෝධී උද්ඝෝෂනයට කට වචනයෙන් මඳ සහායක් දෙමින් කියා සිටියේ චීනය "බොහෝ ආක්‍රමනකාරී ලෙස තම වාසියට වෙලඳ ක්‍රමය හැසිරවීමේ සූදුවක නිරතව සිටින" බවයි. "මූල්‍ය උප්පරවැට්ටිය ඊට එක් නිදසුනකි" කෙසේ වෙතත් එවන් ආරක්ෂනවාදී ක්‍රියා තහනම් කර ඇති ලෝක වෙලඳ සංවිධානයේ නීති වලට පටහැනිව යන එවන් නීති කොන්ග්‍රසය විසින් පැනවීම නිරර්ථක බව ඔහු කියා සිටියේය.

ඇමරිකානු ව්‍යාපාරිකයේ වැඩි පංගුවක් සමග එක්ව ධවල මන්දිරය ද ආර්ථික අර්බුදය මත වෝල් වීදිය කෙරෙහි පලවන මහජන කෝපය පීලිපන්නවා එය විදේශීය දුක්ගන්නාරාල කෙනෙක් වෙත හැරවීමෙහිලා චීන විරෝධී වාචාලකම් යොදාගැනීමේ වටිනාකම තේරුම්ගෙන සිටියි. එහෙත් ඇමරිකානු මූල්‍ය ප්‍රභූ පැලැන්තිය චීනයට එරෙහි වාචික හරඹය සෘජු පියවර ගැනීම කරා පැතිර ගොස් ගෝලීය වානිජ්‍ය ක්‍රමයට වලකපා ලෝක ආර්ථික හා මූල්‍ය අර්බුදය උත්සන්න කර හා සමහර විට ඇමරිකානු අධිරාජ්‍යවාදයේ දෘෂ්ටි ආස්ථානයෙන් වඩාත් වැදගත් එහි ප්‍රධාන නය හිමියාගෙන් වියෝවීමේ හැකියාව වටහාගෙන සිටියි.

අවසාන වශයෙන් එවන් පනතක් බලගැන්වීමට සිදු වුවත් චීනය සමග වෙලඳ යුද්ධය තනි රටක ප්‍රතිපත්ති හේතුකොටගෙන නොව ධනේශ්වර පද්ධතියේම ගෝලීය අර්බුදයේ නිමැවුමක් වන ඇමරිකානු නිෂ්පාදන කර්මාන්තයේ හා ඇමරිකානු කම්කරුවන්ගේ ජීවන තත්වයන්ගේ පරිහානිය ආපසු හරවනු නැත. ලෝක ආර්ථිකය කෙරෙහි එහි කම්පන බලපෑම් සැබවින්ම රැකියා විනාශ කරනු මිස ඒවා නිර්මානය නොකරනු ඇත.

ඊටත් වඩා අන්තරායකාරී වන්නේ එවන් ක්‍රියාවක් ආසියානු පැසිෆික් කලාපයේ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ දිගුකාලීන ආධිපත්‍යයට තර්ජනයක් වන පරිදි නැඟී එන මිලිටරි මෙන්ම ආර්ථික බලවතෙකු ද වන චීනය සමග එක එල්ලේ මිලිටරි ගැටුමක් දෙසට ගන්නා නාටකාකාර පියවරක් ද වීමයි.

සෙනේට් සභාවේ ඩිමොක්‍රටිකයින් ආර්ථික යුදවාදයේ බෙර හඬවද්දී මන්ත්‍රී මන්ඩල රිපබ්ලිකානුවෝ "කොමියුනිස්ට් චීනය" එක්සත් ජනපදයට එරෙහිව මිලිටරි සූදානම හා ක්‍රමානුකූල ඔත්තු බැලීම් ඉහල නැංවීමේ යෙදී සිටින බවට ඒකාකෘතික රක්ත භීතිකාවක් මවා පාති. මන්ත්‍රී මන්ඩලයේ බුද්ධි අංශ කමිටුවේ සභාපති මිචිගන්හි රිපබ්ලිකානු මයික් රොජර්ස් 04දා හමුවේදී කියා සිටියේ බීජිනයේ අන්තර්ජාල ඔත්තු බැලීම් "නොඉවසියහැකි මට්ටමකට ලඟාවී ඇති" බවත් "මෙම වසංගතය නිමාවකට පත්කිරීම" පිනිස එක්සත් ජනපද හා යුරෝපීය ඒකාබද්ධ පියවරක් කැඳවුම් කරන බවත්ය.

මෙම සතියේ පෙන්ටගනය නිකුත් කල වාර්තාවකින් චීන සැපයුම්කරුවන්ගෙන් පමනක් ලබාගත හැකි දුර්ලභ ඛනිජ ලෝහ මත එක්සත් ජනපද අවි නිෂ්පාදනය රඳපවතින තරම විදහා දැක්වී ය. නූතන යුද කර්මාන්තයට වැගත් වන අධි තාක්ෂනික විදුලි ජනක නිෂ්පාදනයේදී තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටුකරන මූලද්‍රව්‍ය 17ක් සඳහා භාවිතා කරන අංගාරිකාම්ල සංයෝගයක් වන දුර්ලභ ඛනිජ වලින් සියයට 95ක්ම දැනට නිෂ්පාදනය කරන්නේ චීනය යි. 04දා නිකුත් කල වාර්තාව එවන් ලෝහ පිලිබඳව "චීන නොවන ස්ථිර මූලාශ්‍රයක අවශ්‍යතාවය" ගැන සඳහන් කලේ ය.

පූර්වයෙන් පලවූ පෙන්ටගන් වාර්තා අවධානය යොමුකර තිබුනේ විශේෂයෙන්ම ආසියානු මහාද්වීපයට දකුනෙන් හා නැගෙනහිරෙන් පිහිටි ඕස්ට්‍රේලියාව-ඉන්දු චීනය හා ජපානය වැනි දිවයින් ප්‍රදේශයන්හි එක්සත් ජනපද ආධිපත්‍යයට තර්ජනයක් වන්නේ යයි කියනු ලබන චීනයේ ආර්ථික හා මිලිටරි කටයුතුවල වර්ධනය මත ය. ඇමරිකානු අධිරාජ්‍යවාදයට එවන් එදිරිවාදියෙකු තරවෙන ආකාරය නොතකා දිගටම කටයුතු කල නොහැකි අතර මිලිටරි පියවරයන් සඳහා මහජන මතය වාත්තු කිරීමේ උද්ඝෝෂනයක කොටසක් ලෙස එය "ඇමරිකානු රැකියාවන්ට" එල්ල වනවා යයි කියන තර්ජනය ගසාකනු ඇත.

මෙම සන්දර්භය තුල අතිශයින්ම අන්තරායකාරී ක්‍රියාකලාපයක් ඉටු කරන්නේ ඩිමොක්‍රටිකයින්ගේ ඉව බව නැති ස්වෝත්තමවාදයයි සමහර විට ඉතාමත්ම ඇට්ටර සෙනේට් සභිකයෙකු වන ෂූමර් එක් ප්‍රකාශයක් තුල මෙසේ සඳහන් කර තිබුනි. "මම වනාහි ඇමරිකානු රැකියා හා ඇමරිකානු නිෂ්පාදනයේ නාමයෙන් සුදු කොඩිය එසවීමට සූදානම් නැති අය අතුරෙන් එක් කෙනෙකි".

ඔහු මෙසේ ද පැවසීය "ක්‍රීඩා පිටිය සමතලා එකක් නම් පමනක් ඇමරිකානු නිෂ්පාදනයන්ට මෙරට දී පමනක් නොව චීනය තුලත් ලෝකය පුරාත් චීන තරඟකාරීත්වයට එරෙහිව සාර්ථක ලෙස නැඟී සිටිය හැකි බව මම දන්නෙමි." මෙම තර්කයේ ස්වභාවය ගැඹුරින්ම ප්‍රතිගාමී වන්නේ එය අධිරාජ්‍යවාදී යුද්ධයට සහාය ගොනු කරන නිසා පමනක් නොවේ.

"සමතලා ක්‍රීඩා පිටියක්" පිලිබඳ ෂූමර්ගේ ප්‍රකාශයෙහි අර්ථය චීනයේ තරමට ම ඇමරිකානු කම්කරුවන්ගේ වැටුප් හා ජීවන තත්වයන් මට්ටම් කල යුතු බවයි. ඇමරිකානු ව්‍යාපාර ලොක්කන් තම විදේශ තරඟකරුවන් සමග ඇමරිකානු සමාගම් "තරඟකාරී" තත්වයට ගෙනඒම යනුවෙන් අදහස් කරන්නේ ද හරියට ම ඒ දෙයයි.

වැටුප් පහත හෙලීමේ එවන් පිලිවෙතකට එකම විකල්පය වැඩකරන ජනතාවන් සියල්ලගේ ජීවන තත්වයන් යහපත් මට්ටමකට නැංවීම සඳහා වන පොදු අරගලයක් තුල ඇමරිකානු-යුරෝපීය-චීන-ජපන් හා ලෝකය පුරා කම්කරුවන්ගේ ජාත්‍යන්තර එකමුතුවයි. මෙය කල හැක්කේ ධනවාදයටත් ජාතික රාජ්‍ය පද්ධතියටත් අවසන් තිත තබමින් සියල්ලන්ගේ රැකියා හා ජීවන තත්වයන් සඳහා අව්‍යාජ සමානත්වය සමග ලෝක සමාජවාදී සමාජයක් නිර්මානය කිරීමේ අරගලය තුලින් පමනි.

**පැට්‍රික් මාටින්**

© www.wsws.org